# ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත

பிரதான செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்

Chief Secretary's Office – North Western Province

පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල - மாகாண சபை அலுவலகத் தொகுதி, குருநாகல் - Provincial Council Office Complex, Kurunegala.

ආයතන හා පරිපාලන අංශය

தாபனமும் நிருவாக பிரிவு

Establishment and Administration Division


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No – NWP/CS/AD/05/7/10/2 - 2018 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No – | දිනය / திகதி / Date – 2018.05.07 |

පළාත් ආණ්ඩුකාරවර ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
සියළුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් ,
සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

## වයඹ පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2018

2018 වර්ෂය සඳහා වයඹ පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමට මා විසින් තීරණය කර ඇති බැවින් පහත උපදෙස් පරිදි එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

2.1 ඔබ ආයතනයේ 2017.12.31 දිනට පහත 2.1.1 හා 2.1.2 හි සඳහන් සේවා කාලයක් සම්පූර්ණ කරන ලද කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් ලවා මේ සමඟ ඇති ස්ථාන මාරු අයදුම් පත්‍රය සම්පූර්ණ කරවාගෙන 2018.05.31 දිනට පෙර ඔබගේ නිර්දේශය සමඟ අදාළ කඩඉම් මගින් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

2.1.1. වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව / වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශය - අවුරුදු 03 යි

2.1.2 අනෙකුත් සියළුම පළාත් රාජ්‍ය ආයතන - අවුරුදු 05 යි

2.2 ස්ථාන මාරු අයදුම් කිරීමේ දී නැවත නැවත සංශෝධන ඉල්ලීම් ඉදිරිපත් නොවන පරිදි ස්ථාන මාරු වීමට කැමති නිශ්චිතව නම් කරනු ලබන සේවා ස්ථාන 3 ක් සඳහන් කිරීමට නිලධාරීන්ට උපදෙස් දෙන ලෙස දන්වා සිටින අතර, සඳහන් කර ඇති සේවා ස්ථාන තුනෙන් එකකට ස්ථාන මාරු ලබා දීමට නොහැකි අවස්ථා වලදී වෙනත් ස්ථානයක් ලබා දීමට යටත් වන බවද , නිලධාරීන් දැනුවත් කළ යුතුය.

2.3 මේ සමඟ ඇති ආකෘති පත්‍ර අංක 02 අනුව ඔබ ආයතනයේ වසර 05 කට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් පිළිබඳ සාරාංශයක් ද , ආකෘති පත්‍ර අංක 03 අනුව ස්ථාන මාරු අයදුම් කර ඇති ඔබ ආයතනයේ වසර 05 කට අඩු සේවා කාලයක් සහිත නිලධාරීන් පිළිබඳ විස්තරයක් ද ඉදිරිපත් කළ යුතුය.




ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary – Tel 037-2228019, Fax 037-2223777, e-mail chiefsecretary@nw.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය / பிரதம செயலாளர் அலுவலகம் / Chief Secretary's Office – Tel 037-2231769-72, Fax 037-2222234, e-mail csnwp@sltnet.lk, Web site : www.cs.nw.gov.lk

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) / பிரதி பிரதம செயலாளர் (நிர்வாகம்) / Deputy Chief Secretary (Administration) – Tel 037-2223195, e-mail depcsnwp@sltnet.lk, dcsadmin@nw.gov.lk

2.4 වසර 05 ට අඩු සේවා කාලයක් සහිත නිලධාරීන් ස්ථාන මාරු අපේක්ෂා කරන්නේ නම්, ඒ සඳහා වන විශේෂ හේතු සමඟ ඔබගේ නිර්දේශය ද ඉදිරිපත් කළ යුතුය.

2.5 ඔබ ආයතනයේ වසර 05 හෝ ඊට වඩා වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් අතුරින් විශේෂිත රාජකාරියක් සඳහා යොදවා ඇති නිලධාරීන් සිටී නම්, ඔවුන් සම්බන්ධව ඔබගේ පුද්ගලික නිර්දේශය සහිත සාධාරනීකරණ වාර්තාවක් නිලධාරියාගේ ස්ථාන මාරු අයදුම් පත්‍රයට අමුණා ඉදිරිපත් කළ යුතුය. (පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.)

03. එමෙන්ම පහත සඳහන් කරුණු පිළිබඳව අදාල නිලධාරීන් දැනුවත් කිරීම කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරවමි.

3.1 වසර 05 ට වැඩි සේවා කාලයක් එකම සේවා ස්ථානයේ සේවය කළ ද ස්ථාන මාරු සඳහා ඉල්ලුම් නොකල නිලධාරීන් හා ස්ථාන මාරු සඳහා ආයතන නම් නොකළ නිලධාරීන් සඳහා සේවා අවශ්‍යතාවයන් අනුව ලබා දෙන ස්ථාන මාරු සම්බන්ධයෙන් කරනු ලබන අභියාචනා සලකා බලනු නොලැබේ.

3.2 නිලධාරීන් සඳහා ස්ථාන මාරු ලබා දුන් පසුවත්, ඇතැම් ආයතන ප්‍රධානීන් විසින් විවිධ හේතු ඉදිරිපත් කරමින් ඔවුන්ගේ ස්ථාන මාරු අවලංගු කරන ලෙස වරින් වර මා වෙත ඉල්ලීම් කරන බැවින්, එවැනි නිලධාරීන් නිදහස් කිරීමට හැකි වන පරිදි සුදුසු නිලධාරීන් හට අදාළ විෂයයන් පිළිබඳ පුහුණුවක් ලබා දීම හෝ වෙනත් සුදුසු විකල්පයක් කල් වේලා ඇතිව යොදා ගැනීම ඔබගේ වගකීම වේ.

3.3 වහාම ක්‍රියාත්මක වන පරිදි සුහද ස්ථාන මාරුවීම් හා අනෙකුත් ස්ථාන මාරු සියල්ල නැවත නියමයක් කරන තෙක් මෙයින් අත්හිටවනු ලැබේ.

3.4 අන්තර් පළාත් ස්ථාන මාරු මෙතෙක් සිදු කළ පරිදි සාමාන්‍ය ක්‍රමයට සිදු කළ හැකිය.

04. ඉහත උපදෙස් අනුගමනය කර මෙම වාර්ෂික ස්ථාන මාරුවීම් බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

පී.බී.එම්. සිරිසේන,
ප්‍රධාන ලේකම්,
වයඹ පළාත.

ඇමුණුම 01

**වයඹ පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2018**

**අයදුම් පත්‍රය**

01. නිලධාරියාගේ නම :- ....................................................................................................

02. උපන් දිනය :- ....................................... 03. තනතුර හා ශ්‍රේණිය :-.............................................

04. වර්තමාන සේවා ස්ථානය :- ....................................................................................................

05. එම ස්ථානයේ සේවා කාලය :-....................................................................................................

06. ස්ථිර පදිංචි ලිපිනය :-....................................................................................................

07. දුරකථන අංකය :- ....................................................................................................

08. ඔබ සේවය කරන ලද සේවා ස්ථාන හා කාලසීමා

| ස්ථානය | කාලය |
|---|---|
| 1. ............................................... | ................................ |
| 2. ............................................... | ................................ |
| 3. ............................................... | ................................ |
| 4. ............................................... | ................................ |
| 5. ............................................... | ................................ |

01. ඔබට ස්ථාන මාරු වී යාමට අවශ්‍ය වන සේවා ස්ථාන 3 ක් මනාපය පරිදි සඳහන් කරන්න

1. ....................................................................................................
2. ....................................................................................................
3. ....................................................................................................

02. ස්ථාන මාරු අයදුම් කිරීමට හේතු :-....................................................................................................

මවිසින් මෙහි දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

................................... ......................................................

දිනය අයදුම්කරුගේ අත්සන

03. ආයතන ප්‍රධානියාගේ නිරීක්ෂණ හා නිර්දේශ :-

මෙම නිලධාරියා/නිලධාරිනිය අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව/පසුව ලබා ගැනීමේ පදනම මත ස්ථාන මාරු කිරීම නිර්දේශ කරමි.

................................... ......................................................

දිනය ආයතන ප්‍රධානියා

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

................................... ......................................................

දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියා

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

................................... ......................................................

දිනය අමාත්‍යාංශ ලේකම්/ලේකම

ඇමුණුම 02

........................................
........................................
........................................

ප්‍රධාන ලේකම්,

ප්‍රධාන ලේකම් කාර්යාලය,

වයඹ.

<u>වයඹ පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2018 (වසර 05 ට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන්)</u>

පහත නම් සඳහන් නිලධාරින්/නිලධාරිනියන් ගේ ස්ථාන මාරු අයදුම්පත් නිර්දේශ කොට මේ සමඟ එවමි.

| අංකය | නිලධාරියාගේ/නිලධාරිනියගේ නම | මුල් පත්වීමේ දිනය | වර්තමාන පංතිය හා ශ්‍රේණිය | වර්තමාන පංතියට පත් වූ දිනය | වර්තමාන කාර්යාලයට වාර්තා කළ දිනය | නිර්දේශය අනුප්‍රාප්තිකයෙකු රහිතව/සහිතව/පසුව ලබා ගැනීමේ පදනම මත |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

දිනය - ............................

............................................................

ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා

ඇමුණුම 03

.......................................

.......................................

.......................................

ප්‍රධාන ලේකම්,

ප්‍රධාන ලේකම් කාර්යාලය,

වයඹ.

**වයඹ පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2018 (වසර 05 ට අඩු සේවා කාලයක් ඇති නිලධාරීන්)**

පහත නම් සඳහන් නිලධාරින්/නිලධාරිනියන් ගේ ස්ථාන මාරු අයදුම්පත් නිර්දේශ කොට මේ සමඟ එවමි.

| අංකය | නිලධාරියාගේ/නිලධාරිනියගේ නම | මුල් පත්වීමේ දිනය | වර්තමාන පංතිය හා ශ්‍රේණිය | වර්තමාන පංතියට පත් වූ දිනය | වර්තමාන කාර්යාලයට වාර්තා කළ දිනය | නිර්දේශය අනුප්‍රාප්තිකයෙකු රහිතව/සහිතව/පසුව ලබා ගැනීමේ පදනම මත |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

දිනය - ..............................

..........................................................

ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා